

# පිටතට පැමිණීම

විකල්ප ලිංගික දිශානතීන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවන්
ඇති දරුවන් සිටින දෙමව්පියන් වෙත.

විවිධ ලිංගික දිශානතීන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවන් ඇති දරුවන් සිටින දෙමව්පියන් වෙත යන මෙම කෘතිය EQUAL GROUND කොළඹ, ශ්‍රී ලංකාව ආයතනයේ ප්‍රකාශනයක් වන අතර එය අධ්‍යාපන අවශ්‍යතාවයන් සඳහා පමණක් අවසර නොමැතිව ප්‍රති නිෂ්පාදනය කළ හැකිය. එම කිසිදු නිෂ්පාදනයක් ලාභය සඳහා විකිණිය නොහැකි අතර මෙම ප්‍රකාශනයේ කිසිදු උපුටාගැනීමක් හෝ වෙනස්කර යොදාගැනීමක් සිදුකරන්නේ නම් එහිදී කෘතියේ සම්පූර්ණ මූලාශ්‍රය දැක්විය යුතු ය. වෙනත් හේතුන් සඳහා ප්‍රතිනිෂ්පාදනය කිරීමට EQUAL GROUND ආයතනය වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කර අවසර ලබා ගත යුතු ය.

රචනය: මයිකල් මෙන්ඩිස් සහ රොසෑනා ෆ්ලේමර් කල්දේරා
සංස්කරණය: රොසෑනා ෆ්ලේමර් කල්දේරා / තුෂාර මනෝජ්
ග්‍රැෆික්ස්: හිරාන් හේමන්ත
මුද්‍රණය: සමයවර්ධන මුද්‍රණාලය
දෙවන මුද්‍රණය

## හැඳින්වීම

දරුවෙකුට, විශේෂයෙන් ගැටවර වියේ පසුවෙන්නෙකුට තමන් සමරිසියෙකු බව අවම වශයෙන් යහළුවෙකුටවත් හෙළි කිරීම ඉතාමත්ම අපහසු වන අතර එමගින් ඔවුන්ට තමන්ගේ දෙමව්පියන්ට තමන්ගේ ලිංගික දිශානතිය අනාවරණය කිරීම කොතරම් අපහසු දැයි කෙනෙකු අවබෝධ කරගත යුතුය.

දරුවෙකු තමන්ගේ ලිංගික දිශානතිය කුමක්ද යන්න තම දෙමව්පියන්ට පැවසීමට අකමැති වීමට හේතු ගණනාවක් තිබේ. දෙමව්පියන් තමන් කෙරෙහි කළකිරෙනු ඇතැයිද, ඔවුන් විසින් හුදෙකළා කරනු ඇතැයිද සහ ඔවුන් විසින් දඬුවම් කෙරෙනු ඇතැයි යනාදී වශයෙනි. භීතිය ඒ අතුරින් වඩාත්ම තීරණාත්මක හේතුව වේ. ඊට අමතරව බොහොමයක් LGBT නව යෞවනයින් විසින් ඔවුන්ගේ ජීවිතවල සිදු වෙමින් තිබෙන දේ සහ සමරිසිභාවය යනු කුමක්දැයි දෙමව්පියන් තේරුම් නොගන්නා බවට තද විශ්වාසයක් සිත්හි දරාගෙන සිටී. අවාසනාවකට මෙන් දෙමව්පියන්ගේ නොදැනුවත්කම ගැන මෙම දරුවන් තුළ පවතින විශ්වාසය බොහෝ විට නිවැරදිය.

සමරිසිභාවය අස්වාභාවික හා අමනුෂ්‍ය යැයි සැලකූ එමෙන්ම සමරිසිභාවය දරුණු ලෙස නොඉවසනු ලැබූ ශ්‍රී ලංකාව යනු සමරිසිභාවයට අදාල කාරණා විශාල වශයෙන් පුළුල්වම වැරදි ලෙස වටහා ගැනීමටත් වරදවා පැහැදිළි කිරීමටත් ලක් වූ රටකි. බොහොමයක් පුද්ගලයින් ලිංගිකත්වය තේරුම් ගන්නා ආකාර තීරණය කරන සම්ප්‍රදායික විශ්වාස පද්ධතිය සහ සංස්කෘතික භාවිතයන් සමග දෙමව්පියන්ට පවා ලිංගිකත්වයේ ඇති ස්වභාවික හා ජීව විද්‍යාත්මක නියමයන් පිළිබඳ ඇති නොදැනුවත් කමත් ඒ අනුව සමරිසිභාවය යනු අස්වාභාවික දෙයකැයි යනුවෙන් සමාජයේ පවතින පොදු අදහස අනුගමනය කරන්නට වීම ලංකාවේ දී අනිවාර්යතාවයකි. දෙමව්පියන් තමන්ගේ සමරිසිභාවය හෝ විවිධත්වය පිළිනොගන්නා බව දන්නා LGBT දරුවන්ට තම ලිංගික අනන්‍යතාවය දෙමව්පියන්ගෙන් වසන් කර තබා ගැනීමට හොඳ හේතු තිබෙනු ඇත.

නමුත් දරුවන්ට දෙමව්පියන්ගේ අවශ්‍යතාවය විශ්වීය සත්‍යයකි.මෙය විශ්වීය සත්‍යයක් නිසාම එය LGBT දරුවන්ටද අදාළ වෙයි. විශේෂයෙන්ම තමන් සමරිසියෙකු වීම දෙමව්පියන්ට අනාවරණය කිරීම මගින් ඔහුට හෝ ඇයට ලැබෙන පවුලේ රැකවරණය මගින් ඔහු හෝ ඇයට සමාජයෙන් සිදුවිය හැකි විවිධාකාරයේ අපචාරවලින් ආරක්ෂා කර ගත හැකිය.

ඔබගේ පුතා හෝ දියණිය ඔබට ඔහු හෝ ඇය සමරිසියෙකු යැයි හෙළිදරව් කළහොත් (හෝ හෙලිදරව් කළවිට එම අවස්ථාව හැසිරවීම සඳහා ඔබට අවශ්‍ය මාර්ගෝපදේශනයක් මෙම පොත් පිංච තුළින් සපයනු ඇත. ඔබේ දරුවාට මෙන්ම ඔබටද උදව් වීම වෙනුවෙන් ඔබට ඔබේ තීරණ හා ක්‍රියාකාරකම් වල දී ප්‍රයෝජනවත් අදහසක් මේ පොත් පිංචෙන් ලැබෙනු ඇත.

**ඔබ දැනගතයුතු යම් දෙයක්.**

මේ පොත් පිංච පුරාවටම LGBT කෙටි යෙදුම ඔබ දකීවි. එය සමරිසි ස්ත්‍රීන්, සමරිසි පුරුෂයින්, ද්විරිසි පුරුෂයින් හා ස්ත්‍රීන් හා සංක්‍රාන්ති සමාජභාවීය පුරුෂයින් හා ස්ත්‍රීන් වෙනුවෙන් යෙදෙන කෙටි පදයයි (Lesbian, Gay, Bisexual, Transgender, Intersex, Questioning)

Lesbian (ලෙස්බියන් - සමරිසි ස්ත්‍රීන් හැඳින්වීමට යොදා ගන්නා වචනයයි. කාන්තාවක් ලිංගිකව, මනෝවිද්‍යාත්මක හා ආධ්‍යාත්මිකව තවත් කාන්තාවකට ආකර්ශනය වීම මින් අදහස් කෙරේ.

Gay (ගේ - සමරිසි පුරුෂයන් හැඳින්වීම සඳහා යොදන වචනයයි. පුරුෂයෙක් ලිංගිකව, මනෝවිද්‍යාත්මක හා ආධ්‍යාත්මිකව තවත් පුරුෂයෙකුට ආකර්ශනය වීම මින් අදහස් කෙරේ. පොදුවේ සමරිසි ප්‍රජාවම හැඳින්වීමටද මෙම ගේ යන පදය භාවිත කෙරේ.

Bisexual (බයි සෙක්ෂුවල් - ද්විරිසි ස්ත්‍රීන් හා පුරුෂයින්, ලිංගිකව, මනෝවිද්‍යාත්මක හා ආධ්‍යාත්මිකව කාන්තාවන් හා පුරුෂයින් යන දෙපාර්ශ්වයටම ආකර්ශනය වන ගැහැණුන් හා පිරිමින් මෙයින් අදහස් වේ.

Transgender (සංක්‍රාන්ති සමාජභාවීය - තමන් ජීව විද්‍යාත්මකව උපත ලද ලිංගිකත්වයට හෝ ජීව විද්‍යාත්මකව ලැබුණු ලිංගික අවයවවලට අනුව සමාජයෙන් බලාපොරොත්තුවන හැසිරීමට විරුද්ධව මනස ක්‍රියාකරන පුද්ගලයින් මෙ නමින් හැඳින්වේ. එනම් පුරුෂයෙකු ලෙස ජීව විද්‍යාත්මකව ඉපදෙන තැනැත්තෙකු මනසින් කාන්තාවක වීම නිසා කාන්තාවක් ලෙස හැසිරීමත්, උපතින් ගැහැණියක ලෙස ඉපදුණු තැනැත්තෙකු මනසින් පුරුෂයෙකු වීම නිසා පුරුෂයෙකු ලෙස හැසිරීමත්ය.

Heterosexual/Straight - විෂම ලිංගික - ලිංගිකව, මනෝවිද්‍යාත්මක හා ආධ්‍යාත්මිකව විරුද්ධ ලිංගිකයෙකු වෙත ඇති ආකර්ශනය වීම මින් අදහස් කෙරේ.

ඇතැම් අවස්ථාවන් හි දී මේ කෘතිය තුළ "ගේ" හෙවත් සමරිසි යන වදන සියලුම විකල්ප ලිංගික දිශානතීන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවන් පැහැදිලි කිරීම වෙනුවෙන් පොදුවේ යොදාගෙන ඇත. ඒ ලේඛකයාගේ පහසුව සඳහාම පමණි. එයින් මෙහි සඳහන් කර නැති අනෙකුත් ලිංගික දිශානතීන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවන් සහිත පුද්ගලයින් සඳහා අන්තර්ගතය අදාල නොවන බවක් හඟවන්නට උත්සාහ කරන්නේ නැත. සඳහන් වන බොහොමයක් දේ සියලුම ලිංගික දිශානතීන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවන්වලින් යුක්ත

**ඔබේ දරුවාගේ ලිංගිකත්වය පිළිබඳ විමසා බැලීම**

කෙසේවෙතත්, ඔබේ දරුවා සමරිසියෙක්ද ද්විරිසියෙක්ද නැතහොත් සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙක්ද LGBT යන්න විමසා බැලීමට ආකාරයන් දෙකක් ඇත. සරලතම හා වඩාත්ම සුදුසුම ආකාරය නම් ඔබේ දියණිය, පුතා ඔබට ඔවුන් ගැනම පැවසීමයි. මෙය පොදුවේ "පිටතට පැමිණීම" / විවෘත වීම නමින් හැඳින්වේ. එතරම් සතුටු දායක ක්‍රමයක් නොවන දෙවන ක්‍රමයෙන් ඔබ ඔබේ පුතාගේ හෝ දියණියගේ ලිංගිකත්වය ඔවුන්ගේ එකඟතාවයකින් හෝ දැනුවත්කමකින් තොරව සොයාගැනීම; වෙනත් අයෙක් එය ඔබට පැවසීම, නැතිනම් උදාහරණයක් ලෙස ඔබ දරුවාගේ දිනපොතක් කියවීමෙන් හෝ එවැනි ආකාරයකින් තොරතුරු හරහා දැනගැනීම කළ හැක. එය "පිටතට පැමිණවීම" / විවෘත කරවීම නම් වේ.

## පිටතට පැමිණීම / විවෘත වීම

ඔබේ පුතා හෝ දියණිය ඔබ වෙත පැමිණ හෝ ක්‍රමිකව ඔබට සමීපව ඔවුන් සමරිසියෙකු යැයි ද්විරිසි-යෙකු යැයි හෝ සංක්‍රාන්ති සමාජභාවීය කෙනෙකු LGBT යන්න පැවසුව හොත් ඔබ මූලිකව පැහැදිලි කර ගත යුතු කාරණා කිහිපයක් ඇත.

- තම ලිංගික දිශානතිය පිළිබඳව මිතුරකු සමඟ විවෘත වීමෙන් පසු මෙම තොරතුරු මිතුරා මත ඇති කරවන හැඟීම වෙනස් කිරීමට හෝ එයට සංවේදීව ප්‍රතිචාර දැක්වීම ඉතාමත්ම අපහසුය. යෞවනයෙක් හෝ යෞවනියක් ඔවුන්ගේ ලිංගික දිශානතිය තම දෙමව්පියන් සමඟ කතා කිරීමට සූදානම් නම්, දෙමව්පියන්ට තම අනන්‍යතාවය අනාවරණය කරන්නේ නම්, ඉන් අදහස් වන්නේ තම දෙමව්පියන් සමඟ ස්ථිර ලිංගික අනන්‍යතාවයක් ඇති කරගැනීමේ අවදානමට මුහුණ දීමට සූදානම්ව සිටින බවයි. එය කළ හැකි වන්නේ දරුවා තනිව බොහෝ දුරට මේ පිළිබඳව සිතා ඇත්නම් පමණි.

- තමන් සමරිසියෙකු විය හැකි බව අවබෝධකර ගැනීම දරුවෙකුට ඉතාම අපහසු කාර්යයකි. මේ සඳහා සමවයස් සගයන් සමඟ තමන්ව විශාල වශයෙන්ම සැසඳීම, තමන්ගේ ස්වයං-වටිනාකම පිළිබඳ නිරන්තරව ප්‍රශ්න කිරීමකට යොමු කරවීමට ඔවුන්ට සිදුවේ. ඔවුන් තමන්ගේ ලිංගික දිශානතිය තම දෙමව්පියන් ඉදිරියේ පිළිගැනීමට සූදානම් වන්නේ තමන් පිළිබඳව විශාල වද-විභාගයක් හරහා පැමිණි වේදනාකාරී ක්‍රියාවලියකින් පසුවයි. බොහෝ විට මෙය ඔවුන් තනිවම විඳ දරාගත් වේදනාත්මක ක්‍රියාවලියක් විය හැකිය.

- සමරිසි කාන්තා, පිරිමි සහ සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයින් නම් පටබැඳීම, තාඩන පීඩනයන්ට, හෝ කොන්කිරීම වැනි බොහෝ බලපෑම් වලට සම-වයස් කණ්ඩායම් අතර නතු වන නිසාම එයින් වේදනා විඳියි. එවන් අපයෝජන වලට ගොදුරු වූ පුද්ගලයින් ලෙස තම වටිනාකම හෝ වලංගුභාවය ගැන පිළිතුරු නොසැපයුණු ප්‍රශ්න ගණනාවක් හිසෙහි දරා ගෙන සිටියි. තමන්ගේ ලිංගික දිශානතිය සහතික කර ගැනීමට දෙමව්පියන් වන ඔබ වෙත දරුවා පැමිණීමෙන් අදහස් වන්නේ, ඔවුන්ට තම ස්වයං-වටිනාකම ගැන යම් අවබෝධයක් තමා තුළම ඇති බවය. දරුවා කෙරෙහි ඔබ ප්‍රතිචාරය දක්වන ආකාරය අනුව තම ස්වයං-වටිනාකම යළි තහවුරු කරගනිමින් දිගු ගමණක් යෑමට බොහෝ ඉවහල් වනු ඇත.

දරුවෙකුට තමන්ගේ ලිංගික දිශානතිය සහතික කිරීම, තම අනන්‍යතාවය සමඟ ස්වයං-එකඟතාවයකට පැමිණීම, එය අනාවරණය කිරීම සරල කාරණයක් නොවන බව ඔබට මේ වන විට පැහැදිලි වී ඇත. බොහෝ දේ අවිනිශ්චිත මොහොතක, තමන්ව ප්‍රතික්ෂේප නොකරනු ඇතැයි ද, තමන්ව ඒ ආකාරයෙන්ම බාරගනු ඇතැයි ද යන අතිවිශාල බලාපොරොත්තුවක් සහ විශ්වාසයක් දරුවා තම දෙමව්පියන් කෙරෙහි තබයි. කෙටියෙන් කිවහොත්, ඔබේ දරුවා ඔහුගේ හෝ ඇයගේ ලිංගික දිශානතිය පිළිබඳ පිළිබඳව ඔබට අනාවරණය කළහොත්, තම වයසට තරම් නොවන මෙවැනි කරුණක් සම්බන්ධයෙන් තම දරුවාගේ පරිණත බව, දරුවාගේ නිර්භීතබව, අවංකබව පිළිබඳව ඔබ ප්‍රථමයෙන් ආඩම්බර විය යුතු ය.

## පිටතට පැමිණීම / විවෘත වීම

තමුන්ගේම කාලය ගෙන, කැමැත්තෙන් තම ලිංගික අනන්‍යතාවය පිළිබඳව විවෘත වීමට තම දරුවාට අවස්ථාව ලබා දීම අතිශයින්ම වැදගත්වන බව ඔබට දැන් වැටහෙනවා ඇති. අන් අය සමඟ, එනම් දෙමව්පියන් සමඟ පවා නිදහසේ කතා කිරීමට හැකි වීමට පෙර දරුවන් ඔවුන් විසින්ම තේරුම්ගත යුතු සමහර දේවල් තිබේ. කෙසේවෙතත්, දරුවන්ගේ අනුමැතියකින් හෝ දැනුමකින් තොරව ඔවුන්ගේ ලිංගික අනන්‍යතාව පිළිබඳව දෙමව්පියන් විසින් සොයා ගැනීම දුර්ලභ දෙයක් නොවේ. එවන් අවස්ථාවලදී වඩාත්ම වැදගත් වන්නේ දරුවාගේ ආරක්ෂාව සහතික කිරීමයි.

දරුවෙකු රහස් කාමරයෙන් පිටතට ඇද දැමීම භයානකය. තමන්ගේ ලිංගිකත්වය හා තම අනන්‍යතාවය පිළිබඳ බොහෝ අවිනිශ්චිතතාවන් තම යෞවන කාලයේදී දී දරුවන්ට තිබිය හැකිය. ඔවුන් තවමත් ඔවුන්ගේ පියාපත් උරගා බලන අතර, ඒ සඳහා ඔවුන්ට අවකාශය අවශ්‍යය වේ. ඔබේ දරුවා සමරිසියෙකු බව ඔබ දැනගත හොත්, ඔහු හෝ ඇය සමඟ ආවේගශීලී ඝට්ටනයකට නොයා දරුවාට ඔබත් සමඟ සංවාදයකට පහසුව සැලසීම වැදගත් වේ. ඔබව දැනුවත් කරගන්න. කල්තබා සමරිසිභාවය ගැන කරුණු කාරණා සොයා ගන්න. දෙමව්පියෙකු වන්න; නිසි අවබෝධයකින් යුතුව සාකච්ඡාවට මුල පුරන්න.

ඔබ ආවේගශීල වී ප්‍රතිචාර දක්වීමකට නොයෑම අතිශයින්ම වැදගත්ය. දරුවාට ඔහුගේ හෝ ඇයගේ ලිංගික අනන්‍යතාවය සකසාගැනීමට අවශ්‍ය වන බවත් ඒ සඳහා විශාල ප්‍රමාණයකින් තමන් ගැනම සිතා බැලීමක් අවශ්‍ය බවත් දැනටමත් සඳහන් කෙරී ඇත. තම ලිංගික දිශානතිය කුමක්ද? මෙය වරදක්ද, මානසික රෝගයක්ද, වෙනත් ලෙඩක්ද යනාදී වශයෙන් තමන් සමගම ප්‍රශ්න කරමින් සිටින දරුවන් ප්‍රශ්න සහ සැකසංකාවන් සහ භීතිකාවන්ගෙන් පිරී ඇත්තේය. මට සිද්දවෙන්නේ මොකද්ද? කවදාහරි මම සාමාන්‍ය වේවිද? හැමදාමත් මම තනි වේවිද? මිනිස්සු දැන ගත්තොත් මට වෛර කරාවිද? මගේ දෙමව්පියන් කුමක් කියාවිද? ඒක පාපයක්ද? ඒක රෝගයක්ද? බෙහෙත් තියෙනවද? මෙවන් චංචල තත්ත්වයක දී දරුවා ගේ ජීවිතයට ඇතුළු වී ඔහු හෝ ඇයට විරුද්ධ වීම අතිශයින් භයානකය. ඔබ විසින් ඔබේ දරුවා තැතිගැනීමකට ලක් කර අවිචාරී හැසිරීම් වලට යොමු කිරීමට ඉඩ ඇත.

## ඔබේ දරුවාගේ ලිංගිකත්වයට ප්‍රතිචාර දැක්වීම

ඔබේ දරුවාගේ ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය නිරාවරණය වීම දෙමව්පියන්ට ඉතා දුෂ්කර අත්දැකීමක් විය හැකියි. පොදුවේ එවැනි දෙමව්පියෙකුගේ මනසේ ඇතිවෙන හැඟීම් සහ ප්‍රශ්න දළ වශයෙන් පහත පරිදි ලයිස්තු ගතකර දැක්විය හැකියි,

**තරහව**
**අස්වාභාවික-අසාමාන්‍ය-ලැජ්ජා සහගත**
**මම ඔහුට හෝ ඇයට වෙනස් ජීවන විලාශයක් ගතකරන්න ඉඩ දෙන්නේ නැහැ!**

**සත්තුවත් මේ වගේ දේවල් කරන්නේ නැහැ!**
**පිරිමියෙකුට තවත් පිරිමියෙක් එක්ක නිදා ගන්න බැහැ. ඒක අසාමාන්‍යයි!**

**පාපය**
**දෙවියන් මෙය ඉවසන එකක් නැහැ!**
**අපේ ආගමට විරුද්ධව ඇයව ඇතිදැඩි කරන්නේ නැහැ!**

සමහර විට තරහව විසින් තාර්කිකත්වය අත්හැර දමයි. ඔබේ දරුවාත් සමඟ තරහා ගැනීමෙන් ඔබේ දරුවාව හෝ දරුවාගේ තත්ත්වය හෝ තේරුම් ගැනීමට කිසිමාකාරයක උපකාරයක් ලැබෙන්නේ නැත. සමහර විට කළ යුතු හොඳම දෙය වන්නේ තමන්ව තැන්පත් කරගැනීමට සහ කරුණු කාරණා ගැන සිතීමට මොහොතක් ගැනීම යි. මේ පොත් පිංචේ කොටස් වලින් සමරිසිභාවයට එරෙහි ඔබේ තරහව අනිවාර්යයෙන්ම සාධාරණීකරණය කළ නොහැක්කේ මන්ද යැයි ඔබට පහදා දේවි.

## බිය

### නොදන්නා දේ පිළිබඳ බිය

*ඔහු කියන එකේ තේරුම මොකද්ද, ඔහු කොල්ලන්ට කැමතියි?*
*ඇය කොහොමද කවදාහරි ගැහැණියක්ව කසාද බඳින්නේ?*
*මගේ දරුවාට මොකද්ද වුණේ?*

### විනාශ වූ අනාගතය පිළිබඳ බිය

*කසාද බැඳලා දරුවන් ලබන්නේ නැතුව ඔහු කොහොමද තේරුමක් ඇති ජීවිතයක් ගත කරන්නේ?*
*මගේ දරුවා තාකි වෙලා තනිව මැරේවිද?*
*මිනිස්සු කවදා හරි මේක දැන ගත්තොත් ඇයව රස්සාවකට ගනීවිද?*

### සමාජයෙන් ප්‍රතික්ෂේප වේ යැයි බිය

*මිනිස්සු ඇයගේ පිටිපස්සෙන් හිනාවේවිද?*
*මේ බව දැනගත්තොත් සමාජයේ කවුරුවත් ඔහුව බරපතලව ගනත් ගනීවිද?*

### නෛතික ප්‍රතිවිපාක පිළිබඳ බිය

*මගේ දුව මේ හින්දා හිරේට දාවිද?*

### ඔවුනගේ සෞඛ්‍ය පිළිබඳ බිය

*මගේ පුතාට කවදා හරි* HIV *හෝ* AIDS *බෝ වේවිද?*
*මගේ දරුවට වෙනයනම් ලිංගික රෝගයක් ඇති වීමේ ඉඩ තියෙන්න පුළුවන්ද?*

සිදුවන්නේ කුමක්දැයි කියා වන බිය සමඟ අරගල කිරීමෙන් ඔබේ මනසේ ඇති විය හැකි ප්‍රශ්නවලින් සමහරක් මෙසේය. ඔබ පාසැල් යන විට ඔබට සමරිසිභාවය හෝ විවිධ ලිංගික අනන්‍යතා ගැන උගන්වා නැති වන්න පුලුවන්. මේ පිළිබඳ මාධ්‍ය මගින් සාකච්ඡාවට ලක්වෙන ආකාරයත් ඔබ දැක නැතුවා වෙන්න පුළුවන්. ඔබ අසා ඇති දේ බොහොමයක්ම නිශේධාත්මක කාරණාය. ඉතිං ඔබේ දරුවාට සිදුවෙමින් තිබෙන දේ ගැන බිය වීම අතිශයින්ම ස්වාභාවිකය. ඔබේ බොහොමයක් ගැටළුවලට පිළිතුරු සැපයීමට අවශ්‍ය දැනුම මේ පොත් පිංචෙන් ඔබට සැපයෙනු ඇත.

**වේදනාව**

**කළකිරීම**

*මට ඇය ගැන සෑහෙන්න සිහින තිබුණා...*
*ඔහු කරපු හැම දේකින්ම ඔහු ඉතාම සාර්ථක වුණා, මේකෙන් ඔහු විනාශ වේවි...*
*මගේ කිසිම දරුවෙක් මට මෙහෙම කරයි කියලා මම කවදාවත් හිතුවේ නැහැ...*

**දුෂ්කරතාවය**

*මිනිස්සු අපේ පවුලට හිනාවේවිද?*
*අසල්වැසියෝ දැන ගත්තොත් මොනවා කියාවිද?*

**වගකීම**

*අපි ඇයත් එක්ක වැඩි කාලයක් ගත කළ යුතුව තිබුණාද?*
*අපි කරපු වැරදි දෙයක් නිසා මගේ පුතා මෙහෙම වුණාද?*
*ඒ  කියන්නේ අපි අසාර්ථක දෙමව්පියන් කියන එකද?*

බොහොමයක් දෙමව්පියන් ඔවුන්ගේ දරුවා සමරිසියෙක්, ද්විරිසියෙක් හෝ සංක්‍රාන්ති සමාජභාවීය කෙනෙක්  බව දැන ගැනීමෙන් වැළැක්විය නොහැකි පරිදි වේදනාවට පත්වේ. නමුත් සමහරවිට මේ වේදනාව ඇතිවන්නේ පුද්ගලයාගේ ලිංගික දිශානතියේ  හෝ ලිංගික අනන්‍යතාවයේ ප්‍රභවය හෝ ස්වභාවය පිළිබඳ ඇති වැරදි සංකල්ප හා වැරදි වටහා ගැනීම් හේතුවෙනි. මේ පොත් පිංචෙන් ඔබට මේ අත්දැකීම මෙහෙයවා ගැනීමට අත්‍යවශ්‍ය දැනුම ලබා දෙනු ඇත.

## දරුවාගේ ලිංගිකත්වය තේරුම් ගැනීම

විවිධ ලිංගික අනන්‍යතා පිළිබඳ ගැටළු සංකීර්ණය. මේ ගැටළුවලින් වඩාත්ම වැදගත් ගැටළු කිහිපයක් ඔබට සංක්ෂිප්තව දැක්වීමට අපට ඉඩ දෙන්න. සමරිසිභාවය, ද්විරිසිභාවය හෝ සංක්‍රාන්ති සමාජභාවය යනු කුමක්ද? ඒවා පුද්ගලයෙකු මත පිහිටන්නේ කෙසේද? එය සාමාන්‍ය තත්වයක්ද? එය රෝගයක්ද? එය සුවකළ යුතුද? මේ කොටස තුළ ඔබට පිළිතුරු දීමට අප උත්සාහ කරන්නේ මේ ගැටළු සම්බන්ධයෙනි.

සමරිසිභාවය යනු පුද්ගලයෙකු සමාන ලිංගිකයෙකු වෙත ආකර්ෂණය වීම ය. ද්විරිසිභාවය යනු පුද්ගලයෙකු ස්ත්‍රී පුරුෂ ලිංගිකයන් දෙපාර්ශවය වෙත ආකර්ෂණය වීම ය. සංක්‍රාන්ති සමාජභාවය යනු පුද්ගලයෙකු ඔහුගේ හෝ ඇයගේ භෞතික ලිංගේන්ද්‍රයන්ට වෙනස්ව සහජ ලිංග-පුද්ගලභාවය දැනීමයි. නැතහොත් උපතින් ලැබුණු ලිංගික අවයව වලට විරුද්ධ ආකාරයට මනස පිහිටීමයිග සමහර පුද්ගලයින් LGBT වීමේ හේතු නොපැහැදිළි වුවත්, ඒවා තවමත් න්‍යායිකව හොඳින්ම පැහැදිය හැකිය.

### මගේ දරුවා සමරිසිභාවය, ද්විරිසිභාවය හෝ සංක්‍රාන්ති සමාජභාවීය කෙනෙකු වන්නේ ඇයි?

දෙමව්පියෙකුට තම දරුවා LGBT වීමෙන් ඇතිවිය හැකි යැයි වැඩියෙන්ම සිතිය හැකි ප්‍රශ්නය නම් “ඇයි?” යන්නයි. මගේ දරුවා සමරිසියෙකු වුනේ ඇයි? හේතුව මොකද්ද? එයාව ඇති දැඩි කරන කොට අපි මොනවා හරි වැරැද්දක් කළාද? ඒක රෝගයක්ද? මේක එයා තෝරාගත්තද?

“සමහරුන් සමරිසි වන්නේ ඇයි?” යන ගැටළුව විද්‍යාඥයින් නිරන්තරව දිගු කාලයක් තිස්සේ සොයාගැනීමට අපොහොසත් වූ ප්‍රශ්නයකි. නමුත් මිලියන ගණනක් පිළිතුරක් සොයා ගැනීමේ පර්යේෂණවලට ආයෝජනය කර තිබුනත්, තවදුරටත් එසේ කරමින් තිබුනත් පැහැදිලිවම එක් හේතුවක් තවමත් සොයාගෙන නැත. එයට හේතුව මේවා පුද්ගලයින්ගේ හැඟීම් සමග සම්බන්ධ වීමයි.

කෙසේ වුවත්, ජෛව විද්‍යාත්මක හේතු මගින් පුද්ගලයින්ගේ ලිංගික දිශානතිය හා අනන්‍යතාවය නිර්ණය කරනු ලබන බවට මේවන විට සොයාගෙන තිබේ. එයින්, සමහර විද්‍යාඥයින්ගේ අදහස වන්නේ ලිංගික දිශානතිය ජාන මගින් තීරණය වන බවයි: පුද්ගලයෙකුගේ අනෙක් ශාරීරික ලක්ෂණ (හිසකෙස් වර්ණය, උස, වමත හෝ දකුණත හුරුබව) සකසන්නාක් මෙන් ලිංගික හැඩගැසීමද ඔහුගේ හෝ ඇයගේ ජාන මගින් තීරණය වෙයි. එහෙත් මේ අදහස තවමත් නිශ්චිතවම ඔප්පු කළ යුතුව තිබුනත්, ක්‍රමිකව විශ්වාසනීයත්වය ගොඩනගා ගනිමින් සිටියි. සමහර අවස්ථාවල පවුලේ සහෝදර සහෝදරියන්ගේ (සමහර අවස්ථාවල නිවුන් සහෝදර සහෝදරියන්ගේ) සමාන ලිංගික හැඩගැසීම් පිළිබඳ කාරණය විසින් මේ න්‍යාය සහාය ලබයි.

එමෙන්ම දරුවෙකු වැඩෙන පරිසරය ඔහුගේ හෝ ඇයගේ ලිංගික අන්‍යතාවය තීරණය කරන බවට ජනප්‍රිය විශ්වාසයක්ද ඇත. මෙයින් කියවෙන්නේ මිනිසුන් වැඩෙන පරිසරය, ළමා වියේදී තිබෙන සම්බන්ධතාවයන්, ඔවුන්ගේ පරමාදර්ශී චරිත, සහ විවිධ අත්දැකීම් යන මේ සියල්ල ඔවුන්ගේ ලිංගිකත්වයේ සංවර්ධනයට බලපාන බවයි.

තවමත් එවැනි දරුවන්ගේ දෙමව්පියන්ට තම දරුවා සමරිසියෙක්, ද්විරිසියෙක් හෝ සංක්‍රාන්ති සමාජභාවීය පුද්ගලයෙක් වන්නේ මන්ද යන්නට ඇති විද්‍යාත්මක කාරණා නොවැදගත්ය. කාරණය නම් විශේෂයෙන්ම මෙවැනි තෝරා ගැනීමක් විවිධාකාරයේ ගැටළු රාශියකට අතවැනීමක් වන ලෝකයක කිසිවකු LGBT වීමට තමා විසින්ම තෝරා නොගන්නා බවයි. එසේම සමහර දෙමව්පියන් සිතන්නේ දෙමව්පියන් ලෙස තමන් ප්‍රමාණවත් නොවූ නිසා තම දරුවන් LGBT වූ බවයි. නමුත් දරුවන්ගේ ලිංගික දිශානතිය සම්බන්ධයෙන් දෙමව්පියන් වගකිව යුතු නැති බව සහතික කළ යුතුය. අනෙක් සියළුම ක්ෂීරපායීන්ගේ මෙන්ම මිනිසුන් අතරද විවිධ ලිංගික හැඩගැසීම් ඉතාමත්ම ස්වාභාවිකය. එය රෝගයක් නොවේ (පහත බලන්න. දරුවෙකුට "සමරිසිභාවය " ඉගැන්වීමෙන් ඇති නොවේ, එය දරුවෙකුට නිවැරදි වර්ගයේ පෝෂණය නොලැබුණ නිසා හෝ වැරදි වර්ගයේ රූපවාහිනී වැඩසටහන් නැරඹීම නිසා ඇති වූවක් නොවේ. සරළවම ඒ ඔවුන් ඉපදුන හෝ වැඩුන

## මගේ දරුවා මානසික රෝගියෙක්ද?

ශ්‍රී ලංකාවේ සිටින බොහෝමයක් මිනිසුන් සමරිසිභාවය මානසික රෝගයක් ලෙස සලකා කටයුතු කරන අතර එය ස්වාභාවික යැයි පිළිගැනීම බටහිර ලෝකයෙන් ආනයනය කළ දෙයකට එකඟවීමක් ලෙස දකී.

■ 1973 දී ඇමරිකානු මනෝචිකිත්සක සංගමය විසින් ඔවුන්ගේ මානසික ආබාධයන්ගේ ලැයිස්තුවෙන් සමරිසිභාවය ඉවත් කර තිබෙන අතර

■ 2001 දී චීන මනෝචිකිත්සක සමාජය විසිනුත්, "චීන මානසික ආබාධ වර්ගීකරණයෙන්" සමරිසිභාවය ඉවත් කළේ ඔවුන්ගේම අවුරුදු පහක පර්යේෂණයන්ට පසුවයි.

ලෝකයේ ප්‍රතිවිරුද්ධ කරුවන් දෙපාර්ශවයම තවදුරටත් සමරිසිභාවය රෝගයක් හැටියට සළකන්නේ නැත. මෙයින් පැහැදිළිවම පෙන්වන්නේ සමරිසිභාවය පිළිගැනීම බටහිර ලෝකයටම පමණක් සීමා වූවක් නොවන බවයි. ඇත්ත වශයෙන්ම ලෝකයටම සෞඛ්‍ය කාරණා පිළිබඳ උපදෙස් හා නිර්දේශ ඉදිරිපත් කරන ලෝක සෞඛ්‍ය සංවිධානය විසින් ඔවුන්ගේ ICD ලැයිස්තුවේ දහවන සංස්කරණයෙන් සමරිසිභාවය මානසික ආබාධ ලැයිස්තුවෙන් ඉවත්කර ඇත.

ඉහත සඳහන් කර ඇති ආයතනයන්ගේ පර්යේෂණික හා සායනික ලියවිලිවල "සමාන-ලිංග ආදර ආකර්ශනයන්, හැඟීම් සහ හැසිරීම් මිනිස් ලිංගිකත්වයේ සාමාන්‍ය සහ ධනාත්මක වෙනස්කම්" හැටියට සදහන් කරයි. ඔවුන් තවදුරටත් සමරිසිභාවය රෝගයක් ලෙස දිගු කාලයක් පැවති වැරදි දැක්ම ඇත්ත වශයෙන්ම වරක් පැවති සමාජ සම්මතයන් මත පදනම් වූ පර්යේෂණයට ලක් නොකළ උපකල්පනයන් වන අතර, එබැවින් ඒවා "අවිද්‍යාත්මක" යැයි සඳහන් කර ඇත.

ඇත්ත වශයෙන්ම ලෝක සෞඛ්‍ය සංවිධානයේ ICD-10ට අනුව සමරිසිභාවය මානසික ආබාධයක් ලෙස සළකන්නේ නැති අතර කෙනෙකුගේ ලිංගික හැඩගැසීම වෙනස් කිරීමේ (උදාහරණයක් ලෙස සමරිසිභාවයේ සිට විෂම ලිංගිකත්වයට යෑමේ ආශාව මානසික ආබාධයක් ලෙස සැළකේ.

අවසාන වශයෙන් කිව යුත්තේ සමරිසිභාවය මානසික ආබාධයක් නොවන අතර එම අදහස පිළිගත් ගෝලීය මනෝචිකිත්සක විශේෂඥයින් විසින් ප්‍රතික්ෂේප කර ඇති බවයි.

### විකල්ප ලිංගිකත්වයන්: අසාමාන්‍යතාවයක් ද?

සමාජයේ සිටින බොහොමයක් පුද්ගලයින් විවිධ ලිංගික අනන්‍යතා සහිත වූවන් එවැනි අනන්‍යතාවන් අසාමාන්‍යතාවයක් ලෙස සළකයි. එයට හේතුව වන්නේ එකම ස්වභාවික ලිංගික හැඩගැසීම වන්නේ (නැතිනම් විය යුත්තේ විෂම ලිංගිකත්වය යි යන ජනප්‍රිය විශ්වාසය ඇදහීම නිසාය.

මිනිසුන් නොවන සත්වයන් අතරද සමරිසි, ද්විරිසි සහ සංක්‍රාන්ති සමාජභාවීය හැසිරීම් පවතින බවට ප්‍රලේඛන ගත සාක්ෂි ඇත. එම හැසිරීම් අතර ලිංගික හැසිරීම, ආදරය ඉල්ලා සිටීම, අනුරාගය, යුගල බැඳීම සහ මා පිය කටයුතු අඩංගු වේ. 1999 බෲස් බේජ්මිල් පර්යේෂකයාගේ විමර්ශනයකින් ප්‍රයිමේටාවන්ගේ සිට පනුවන් දක්වා ජීවී විශේෂ 1500 කට ආසන්න සංඛ්‍යාවක සමරිසි හැසිරීම නිරීක්ෂණය කොට ඇති අතර 500 ක් සඳහා හොඳින් විස්තර සහිතව දක්වා ඇත.

සත්වයන් අතර ඇති සමරිසිභාවය අනුමත කරන අය මිනිසුන් අතර සිදුවන සමරිසි සම්බන්ධතා යුක්ති සහගත නොවන බව පවසයිග සතුන් අතර සමරිසිභාවය තනිකරම සාක්ෂියක් ලෙස භාවිතා කර ඇත්තේ සමරිසිභාවය යනු ස්වභාවික සහජ ආසාවක් යැයි පෙන්වීමටම පමණි.

### අපේ සංස්කෘතිය තුළ සමලිංගිකත්වය

සමහරුන් අපේ සංස්කෘතියට සහ සම්ප්‍රදායට සමරිසිභාවය විරුද්ධ යැයිද, එයට සමාජය තුළ ඉඩ දීමෙන් අපේ වටිනාකම් පිරිහී යෑම සිදු වේ යැයි ද පවසති.

බටහිර ලෝකය අපගේ වටිනාකම් පද්ධතිය තුළට බලපෑම් කිරීමට පෙර බොහොමයක් ආසියානු සංස්කෘතීන් ලිංගික නිදහසට හා විවිධත්වයට ඉඩදුන් බව මෙයට ප්‍රතිචාර වශයෙන් පැවසිය යුතුය. ඇත්ත වශයෙන් තවමත් ඉන්දියාවේ හිජ්රාවරුන් (ලිංග ඡේදනය කළ, ගැහැණුන් සේ ඇඳුම් අඳින පිරිමි දැකීම අළුත උපන් දරුවන්ට සුභ පෙරනිමිත්තක් ලෙස සැළකේ. කුට්ටන්වාඩර් උත්සවය යනු ඉන්දියාවේ ලිංග ඡේදිත පුද්ගලයින්ට විෂ්ණු ප්‍රජාවේ සුවිශේෂී අනුග්‍රහයක් ඇති පිරිසක් ලෙස ගෞරව කිරීමේ උළෙලකි. කජුරාහෝ කෝවිලේ චිත්‍ර වල සිට, වේද, පුරානාස්, ඉතිහාසාස් යන ග්‍රන්ථ වල ලියවිලි දක්වා ආසියානු විද්‍යාවට විවිධ ලිංගික හැඩගැසීමන් ස්වභාවික ලෙස හඳුනා ගැනීමේ පුරාණ සම්ප්‍රදායක් ඇත: ගැහැණු පිරිමි දෙක පමණක් ලිංගික අනන්‍යතාවය ලෙස සළකන යුග්ම ලිංග සංකල්පය බටහිර නිර්මිතය කි. ඇත්ත වශයෙන්ම සියවසකට වඩා පෙර බ්‍රිතාන්‍යයන් විසින් දණ්ඩ නීති සංග්‍රහය මගින් සමරිසිභාවය අපරාධයක් ලෙස සලකන ලදී. එහෙත් පසුකාලීනව සිදුකරන ලද අධ්‍යයනයවල ප්‍රතිඵල මත ඔවුන් විසින් ඔවුන්ගේ රටේ සමරිසිභාවය අපරාධයක් යැයි පැවති නීතිය වෙනස් කර සමරිසි ප්‍රජාවට අයිතිවාසිකම් ලබා දෙන ලදී. මෙම නිසා අප ප්‍රශ්න කළ යුත්තේ විජාතිකයින් විසින් අපට බලෙන් පටවනු ලැබූ යල්පැන ගිය නීති තවමත් අප විසින් කර තබාගෙන යන්නේ ඇයිද යන්නයි.

දෙවනුව, සංස්කෘතිය යනු ඉතිහාසය පුරාවටම මනුෂ්‍යත්වයට එරෙහිව සමාජයේ සමහර ගොරතර අසාධාරණයන් යුක්ති සහගත කිරීම සඳහා සමාජයට සැඟවී සිටීමට බැනරයක් ලෙස භාවිතා කළ දෙයකි. ස්ත්‍රීන් පීඩනයට ලක් කිරීම, ඊනියා "පහල කුල" පුරවැසියන්, සුළු ජාතික කණ්ඩායම්, විදේශික ආගම් ලබ්දීන් ඇති අය පහත්කොට සැළකීම යනාදී සියල්ල යුක්ති සහගත කරන ලද්දේ "සංස්කෘතික අවසරය" මගිනි. බුදුන් වහන්සේගේ සිට මහත්මා ගාන්ධි දක්වා ඓතිහාසික තැනැත්තන් මිනිසුන් පීඩනයට පත්කරන, මිනිස් අයිතීන් උල්ලංඝනය කරන සංස්කෘතික භාවිතයන්ට ප්‍රසිද්ධියේ චෝදනා කර ඇත.

## සමාජය තුළ සමරිසිභාවය

ශ්‍රී ලංකාවේ දී "සාමාන්‍ය" පුද්ගලයෙකු වැඩිවියට පත්වී, හොඳ අධ්‍යාපනයක් ලැබ, සාර්ථක රැකියා මාර්ගයක් ආරම්භකර, විවාහ වී දරුවන් ලැබ පිළිවෙලක් වීම සමාජය විසින් අපේක්ෂා කරයි. සාමාන්‍ය සමාජ සම්මතය හා විය යුත්ත එය යැයි විශ්වාස කරන නිසා දෙමව්පියන් තම දරුවන්ට එවැනි තත්ත්වයක් සිදුකර දීමට අපේක්ෂා කරයි. මේ නිසා සමරිසි, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවීය දරුවන් සිටින දෙමව්පියන්ට තමන්ගේ දරුවා සම්බන්ධව පහත දැක්වෙන ආකාරයේ ප්‍රශ්න ඇතිවිය හැකිය.

මගේ දරුවා කවදාවත් විවාහ නොවුනහොත්? ඔවුන්ගේ අනාගතය මොන වගේ වේවිද? භාර්යාවක් හෝ ස්වාමිපුරුෂයෙක් නැතිව, හෝ ඔවුන්ගේම කියා දරුවන් නැතිව අපෙන් පස්සේ නැතිනම් වයසට ගියාට පස්සේ ඔවුන්ව බලාගන්නේ කවුද? කසාද බඳින්න ඕනෑ නැති ලොකු පුතෙක් දුවෙක් ඉන්න අපි ගැන මිනිස්සු මොනවා කියාවිද?

ගැටළුව වන්නේ "සාමාන්‍ය" වන්නේ කුමක්ද, "පිළිගත හැක්කේ" කුමක්ද යන සමාජයීය සංකල්පනාවන් ඉතා පටු සහ නොපැහැදිලි ඒවා වීමයි. සාර්ථක ජීවිතයක් යනු අත්‍යවශ්‍යයෙන්ම විවාහක ජීවිතයක් නොවන අතර, ලිංගික දිශානතිය කුමක් වූවත් තමාට රිසි හා තමාව තෘප්තිමත් වන ආකාරයේ ජිවිතයක් ගත කිරීම තීරණය කිරීමට සියලු දෙනාටම අයිතියක් තිබේ. එය එසේ තිබියදී දෙමව්පියන්ට සමාජය තුළ "සාමාන්‍ය වීමට", පිළිගනු ලැබීමට, ගෞරව කරනු ලැබීමට, අසාර්ථක දෙමව්පියන් නොවීමට, ස්වභාවික නැඹුරුතාවයක් සහ උනන්දුවක් තිබේ. එබැවින් ඒ නිසා සමරිසි, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවීය දරුවන්ගේ ප්‍රශ්නවලට මුහුණ දීමේදී එවන් දෙමාපියන්ට පහත විකල්පයන් දෙක අනුගමනය කිරීමට සිදු වේ.

එක්කෝ ඔවුන්ගේ දරුවන්ගේ සත්‍ය ලිංගික දිශානතිය තහනම් කර ඔවුන්ට විවාහ වී, දරුවන් ලැබ ඊනියා සාමාන්‍ය ජීවිතයක් ගත කිරීමට බල කිරීම.

නැතිනම්, සියළුම මිනිසුන්ට ප්‍රශ්න ඇති බව පිළිගෙන ඒ නිසා තම දරුවා සමරිසියෙකු වීම හේතුවෙන් සමාජයෙන් ඇතිවන ගැටළු විසඳා ගැනීමට උදවු වෙමින් ඔවුන්ට අවංක ජීවිතයක් ගත කිරීමට උදවු කිරීම.

පළමුවැනි තෝරා ගැනීම භයානක විකල්පයකි, මන්ද යත්. එයින් බොහොමයක් අහිසංකයන්ට ප්‍රීතියෙන් තොර ජීවිත ගතකිරීමට හේතුවේ (පහත බලන්න. දෙවැනි විකල්පය පහසු තෝරා ගැනීමක් නොවේ, නමුත් ප්‍රායෝගිකම විකල්පය එයයි, එමෙන්ම විකල්පයන් දෙකින්ම නිර්භීතම විකල්පයද එයයි.

## බොරුවක ජීවත්වීම: ප්‍රතික්ෂේපය තුළ ජීවත් වීමේ භයානකත්වය

බොහෝ දෙමව්පියන්ට අවශ්‍ය වන්නේ තමන්ගේ දරුවන් සමරිසිවීමෙන් වළක්වා ඔවුන් එම ජීවිතයෙන් "පැත්තකට කර" ඔවුන්ගේ අධ්‍යාපන කටයුතුල රැකියා කටයුතු අවසන් කරනු දැකීමයි. ඉන්පසුව විවාහ වනු දැකීමයි. මෙසේ වන්නේ LGBT පුද්ගලයෙකුට වුවත්, උපරිම "අවධානය" යෙදුවහොත් "සාමාන්‍ය" ජීවිතයක් ගත කිරීමට හැකි යැයි ඔවුන් සිතන නිසා ය. පුද්ගලයෙකුගේ සමරිසිභාවය යනු ඔහුගේ හෝ ඇයගේ ලිංගික අවශ්‍යතාවයන්ට පමණක් සීමාවන දෙයක්ය යනුවෙන් ඔවුන් සිතීම මෙයට හේතුවේ.)

මේ තරම් සත්‍යයෙන් දුරස් සිතීමක් තවත් නොමැත. පුද්ගලයෙකුගේ ලිංගික කැමැත්ත එම පුද්ගලයා කවරෙක්ද යන්න තීරණය කරන ප්‍රධාන අංගයකි. ඔවුන් කැමති දේ, විනෝදාංශ, ඔවුන් තමන්ව ප්‍රකාශයට පත්කරවන ආකාරය, ලෝකය දෙස බලන ආකාරය යන මේ සියල්ලටම ඔවුන්ගේ සමරිසි, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවීය අනන්‍යතාවය බලපායි. එහිදී තමා නොවන අයෙකු ලෙස ජීවත්වීමට ඔවුන්ට සිදුවන්නේ නම් එම නිසා ඔවුන්ට ඔවුන්ගේ අවංක, ස්වභාවික ආශාවන් බොහොමයක් සිරකර ගන්නට සිදු වේ. "සැකයන්" මතු නොවන ලෙසින් හැසිරීමට, තමන්ගේ ව්‍යාජ ජීවිතයේ ක්‍රමවත් බව පවත්වා ගැනීමට, කාර්යාලයේදී හෝ රාත්‍රී කෑම මේසයේ ඇති වන සාමාන්‍ය සංවාදයකදී පවා අතිශයින් පරිස්සම් වීමට ඔහුට හෝ ඇයට සිදුවේ. මෙවැනි ජීවිතයක් ගතකිරීම පුද්ගලයෙකු තුළ අතිශය පීඩාවත් ඇති කළ හැකිය.

පුද්ගලයින් දෙදෙනෙකු අතර ආදර සම්බන්ධතාවයකදී සහකරුට සහකාරියට ආදරය, සැලකීම, ආරක්ෂාව, ලෙන්ගතුකම සහ අවංකභාවය වැනි දේවල් අවශ්‍ය වේ. සමරිසි පිරිමියෙකු හෝ ගැහැණියක තම සහකරු හෝ සහකාරියගෙන් මේවා බලාපොරොත්තුවන ආකාරය සහ ආශා කරන ආකාරය විෂම ලිංගිකයෙක් ඒවා අපේක්ෂා කරන හෝ ආශා කරන ආකාරයෙන් වෙනස්ය. එබැවින් සමරිසි පුද්ගලයෙක්ට විෂමලිංගිකයෙක් හා විවාහ වීමට බල කළ විට සම්බන්ධතාවය සමබර වන්නේ නැත. එබැවින් පුද්ගලයින් දෙදෙනාම භාවාත්මකව සහ ලිංගිකව අතෘප්තිමත් වනු ඇත. එය අනිවාර්යයෙන්ම අසතුටු විවාහ ජීවිතයක් වනු ඇත, අසතුටු විවාහ ජීවිතයක් ඔවුන් දෙදෙනාට පමණක් නොව විවාහයේ දරුවන්ටද වේදනාකාරී ජීවිතයක් ඇති කරයි. භයානකම අවස්ථාවන් වලදි මෙය ගෘහස්ත ප්‍රචණ්ඩත්වයන්, දුභීත්වයන් , මත්පැන් භාවිතයට යොමුවීම මෙන්ම විවිධ අපයෝජනයන් වැනි දේට යොමුවීමට ඉඩකඩ සලසන කරුණු විය හැකිය.

අපි තේරුම්ගත යුතුම කාරණය නම් සත්‍ය ලිංගික අනන්‍යතාවය යටපත් කර සහ වෙනත් ව්‍යාජ ජීවිතයක් නිරූපනය කරන්නට සිදු වූ ඕනෑම අයෙක් එසේ කරන්නේ ඔවුන්ට සමාජයෙන් ඇති පීඩනය නිසයි. සමාජය අප සියලුම දෙනාට "ප්‍රවාහය සමඟ" යෑමට බලපෑම් කරයි. සමාජයීය අවශ්‍යතාවයන්ට සම්මුති ගතවීමෙන් බොහෝ මිනිසුන්ට අසතුටුදායක ජීවිතයක් ගත කරන්නට සිදු වේ නම්, එම සමාජයීය ඉල්ලීම් ඉවත දැමීම වඩාත් සුදුසුය. එසේ කිරීමෙන් අනෙක් අහිංසක මිනිසුන්ට වේදනා විඳීමට සිදු වන්නේ නැති නිසා සාමාන්‍ය වෙනවාට වඩා වෙනස්ව සිටීම වඩා යහපත්ය. එය බොරුවක ජීවත් වීමක්වත් නිරන්තර බියෙන් ජීවත් වීමක්වත් නොවේ. නමුත් අවම වශයෙන් අවංක වීමෙන් එය අනෙක් අයට අනවශ්‍ය වේදනාවක් ගෙන දෙන්නේ නැත.

## සමරිසිභාවයේ සෞඛ්‍ය අවදානම

ලිංගිකව සංක්‍රමණය වන රෝග සම්ප්‍රේෂණයට සමලිංගික හැසිරීම් හේතු වන බවට බොහෝ පුද්ගලයින් වැරදියට විශ්වාස කරයි. නමුත් ඇත්තටම බොහොමයක් ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝග සියලුම ලිංගික හැඩගැසීම් ඇති පුද්ගලයන් ගෙන් සම්ප්‍රේෂණය විය හැකිය. සමරිසි ප්‍රජාව එයින් විශේෂ අවදානමට ලක්වී නොමැත. ඒඩ්ස් රෝගය විශාලව ඇති අප්‍රිකාවේ බහුතරයක් ලිංගිකව සම්ප්‍රේෂිත ඒඩ්ස් රෝගීන් වාර්තා වී ඇත්තේ විෂම ලිංගික ලිංගික සම්බන්ධතාවයන් ගෙනි. එබැවින් දෙමව්පියන් මෙවැනි රෝගවලින් සමරිසි දරුවකු රැකගත යුත්තේ විෂමලිංගික දරුවෙකු එම රෝග වලින් වළක්වා ගන්නා ආකාරයෙන්මය. බොහොමයක් දෙමව්පියන් තම දරුවන්ට ලිංගිකව හැසිරීමෙන් වැළකීමට, විවාහවීමට සහ විවාහයෙන් පසු පමණක් ලිංගිකව හැසිරෙන ලෙසට උපදෙස් දෙයි; මේ උපක්‍රම සමරිසි දරුවෙකු කෙරහි වෙනස් විය යුතු නැත. අත්වැරැද්දක් සිදුකර නොගැනීමට, අකිකරු වීම වැළැක්වීමට යෞවනයින් කෙරෙහි අවධානයෙන් පසුවීම අවශ්‍ය වන බව සත්‍යයකි. නමුත් මෙය හුදෙක් සමරිසි යෞවන යෞවනයින්ට පමණක් සීමා වූවක් නොව, ලිංගික දිශානතිය කුමක් වුවත් සෑම යෞවනයින්ට පොදුය.

දරුවෙකු ලිංගිකව සම්ප්‍රේෂණය වන රෝගයකට ගොදුරු වීම හෝ නොවීම තීරණය වන්නේ ඔවුන්ගේ ලිංගික දිශානතිය අනුව නොව, දෙමව්පියන්ට තම දරුවන් ආරක්ෂා කිරීමට ඇති හැකියාව මත ය.

## ඔබේ දරුවාගේ ලිංගිකත්වයට උදව් කිරීම

මෙතෙක් දුරට මේ පොත් පිංචේ කොටස්වලින් ඔබට විකල්ප ලිංගික අනන්‍යතාවය යනු කුමක්දැයි යන්න සහ ශ්‍රී ලංකාව තුළ බඨඊඹ වීමේ අර්ථය කුමක්දැයි යන්න තේරුම් ගැනීමට අත්‍යවශ්‍ය වන දැනුම සැපයීමට උත්සාහ කර ඇත.

එයට ඇති සමාජයීය නිශේධාත්මක ආකල්පය කුමක් වුවද ඔබේ දරුවාගේ ලිංගික දිශානතිය ඔහු හෝ ඇය විසින් පිළිගත යුතුව ඇති බව අප විසින් ඔබට පවසා ලැබ ඇත්තෙමු.

ඔවුන්ට "විෂමලිංගික" යැයි ව්‍යාජව පෙනීසිටීමට ඔබ කෙතරම් පෙළඹුවද, බලපෑම් කළද එයින් ඔබේ දරුවාගේ සතුට අහිමි කරනවා පමණක් නොව ඇයගේ/ ඔහුගේ වටා සිටින අයගේද ජීවිත වල සතුට අහිමි කරවන බව අපි ඔබට පවසා ඇත්තෙමු. ශ්‍රී ලංකාව තුළ සමරිසි, ද්විරිසි හෝ සංක්‍රාන්ති සමාජභාවීය ලෙස ජීවත්වීමේදී එයටම ආවේණික වූ ප්‍රශ්ණ සමඟ ජීවත් වන්නට සිදු නොවන්නේ යැයි මෙයින් ඇඟවෙන්නේ නැත. ඇත්ත වශයෙන්ම LGBT ප්‍රජාවේ සාමාජිකයෙක් ලෙස ඔබේ දරුවාට මුහුණ දීමට සිදුවන ගැටළු බොහොමයක් තිබේ. එම ගැටළු සම්බන්ධව දරුවෙකුට ඔහුගේ/ඇයගේ වැඩිහිටි ජීවිතයේ දී මෙන්ම යොවුන් වියේද ඉදිරියට යෑමට දෙමව්පියන්ගේ භූමිකාව ප්‍රධාන වන ආකාරය අපි මේ කොටසින් සාකච්ඡා කරන්නෙමු.

යෞවනයින් තම ලිංගික දිශානතිය හා සමාජය සමඟ කරන අරගලයන් හේතුවෙන් ලෝකය පුරාම විවිධාකාරයේ ඛේදාන්තයන් සිදු වෙමින් ඇත. එය ඔවුන්ට අති දුෂ්කර කාල පරිච්චේදයකි, එමෙන්ම ඔවුන්ට නිවරැදි සහයෝගය නිවැරදි මොහොතේදී ලැබෙන්නේ නැත, එබැවින් ඔවුන්ගේ ජීවිත අනතුරට ලක් වී ඇත. සමරිසි පුද්ගලයෙකුට නිසැකවම දෙමව්පිය සහයෝගය සහ මගපෙන්වීම උපරිම වැදගත් වේ. මෙලෙස සහයෝගය දැක්විය හැකි විවිධාකාරයන් පහතින් සාකච්ඡාවට ලක් කර ඇත.

ඔබේ දරුවන් තමන්ගේ ලිංගිකත්වය පිළිබඳ කරුණු ඔබ වෙත ඉදිරිපත් කිරීමට හෝ නොකිරීමට ඉඩ ඇත. එසේ පැමිණිය හොත් පහත උපදෙස් ක්‍රියාවට නැංවීම ඉතාමත් පහසු වනු ඇත. ඔවුන් නොපැමිණියහොත් ඔබ මාතෘකාව ඉදිරිපත් කිරීමට පෙර ඔවුනට මඳ කාලයක් ලබාදෙන්න. සමරිසිභාවය පිළිබඳ පිළිබඳව ඔබ වෙත පැමිණ කතා කිරීමට බිය විය යුතු නැති බව දරුවාට ඇඟවෙන්නට ඉඩ හැරීමට- සාමාන්‍ය කතාබහ තුළ සමලිංගිකත්වය ගැන සඳහන් කරමින් එයට ඇති තහංචිය අහෝසි කිරීමට උත්සාහ කරන්න.

ඔහු/ඇය ඔබ වෙත පැමිණියහොත් හෝ පැමිණීමේ අවශ්‍යතාවයෙන් සිටිනවා යැයි ඔබට දැණුන හොත්, නැතිනම් ඔවුන් තනිවම අරගලය තුළ සිටිනවා යැයි ඔබට දැණුන හොත් පහත උපදෙස් ක්‍රියාවට නගන්න.

## ඔබේ දරුවාට පිළිගැනීම සහ ශක්තිය ලබා දෙන්න

තමන් සමරිසියෙකු, ද්විරිසියෙකු හෝ සංක්‍රාන්ති සමාජභාවීය කෙනෙකු වියහැකියි යන්න යෞවනයෙකුට ඉතාමත්ම අපහසුකාරී තත්ත්වයකි. ඔවුන් විවිධාකාරී ගැටළු හා අවිනිශ්චිතතාවයෙන් ජීවත්වෙයි. ඇයි මට මේක සිද්ධ වුණේ? මිනිස්සු මොනවා කියාවිද? යාළුවෝ මට වෛර කරාවිද? ඔවුන් දැන ගත්තොත් මොකක් වෙයිද? මම හැමදාම මේ වගේ වේවිද? නැත්නම් කාලයකට විතරද? මේ ගැටළුවල අවසානයක් නැත.

ඔබ කළ යුතු ප්‍රධානම දෙය වන්නේ, ඔහු/ඇය සමඟ ඔබ සැමදා සිටින සිටින බවත්, දරුවාගේ වියවුල සහ වේදනාව තමන්ට හොඳින් වැටහෙන බවත්, සෑම විටම දරුවා සමඟ සෙවනැල්ලක් සේ පසු පසින් සිටින බවත්, දරුවාට වටහා දීම යි. ඕනෑම සිදුවීමකදී දරුවාට තම දෙමව්පියන් ගැන විශ්වාසය තැබිය හැකි බවත් අවබෝධ කර දෙන්න. ඔවුන්ට අවශ්‍ය පිළිගැනීම සහ ශක්තිය ලබා දෙන්න.

## ඔවුන්ට කාලය සහ අවකාශය ලබා දෙන්න

විශේෂයෙන්ම මෙවන් ළාබාල වයසකදී තමන්ගේ ලිංගික දිශානතිය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය සමරිසි, ද්විරිසි හෝ සංක්‍රාන්ති සමාජභාවීය යන ඒවායින් කුමක්දැයි ඉක්මණින් තීරණය කිරීමේ කිසිම අවශ්‍යතාවයක් නැත. මේ සඳහා ඔවුන්ට විශාල කාලයක් අවශ්‍ය විය හැක. ඔවුන්ගේ දෙමව්පියන් ලෙස ඔබ, දරුවා දැන් හෝ පසුව හෝ කුමන ආකාරයකින් තම ලිංගික දිශානතිය ගැන තීරණය කළද ඔබ ඔවුනට ආදරය කරන බවත්, ඔවුන්ව ඒ ආකාරයෙන්ම පිළිගන්නා බවත් යන අවබෝධය දරුවාට ලබා දෙන්න.

දරුවාගේ ලිංගිකත්වය නිරන්තර සාකච්ඡාවන්වල මාතෘකාවක් වීම තුළින් දරුවාව සම්පූර්ණයෙන්ම විනාශකර දමාවි. එහෙත් තම ලිංගිකත්වය පිළිබඳව ඔබ සමඟ විවෘත වීමට ඔවුන්ට ඔබ අවශ්‍ය නම්, ඉඳ හිට ඒ පිළිබඳව කතා කිරීමට වගබලා ගන්න. පළමු සාකච්ඡාවෙන් පසුව, එය මතක් කිරීමෙන් හෝ කතා බහ කිරීමෙන් වැළකී නිහඬව දෛනික කටයුතු වල නිරත වුවහොත්, ඔබට ඒ ගැන කතා කිරීමට අපහසුතාවයක් ඇතැයි සිතීමට දරුවා පෙළඹෙනු ඇත. එමෙන්ම නැවත මතක් කිරීම සම්බන්ධයෙන් අපසුතාවයක්ට ඔවුන් පත්වනු ඇති අතරම නොදැනුවත්වම ඒ සම්බන්ධයෙන් තද තහංචියක් ස්ථාපිත වනු ඇත.

## ඔවුන්ට ස්වයං-අභිමානය ලබාදෙන්න

යෞවනත්වය යනු සම-වයස් කණ්ඩායම්වල විශාල බලපෑමක් ඇති කරන සමයකි. තරුණයන් සමාජය තුළට තමන් හැඩගසා ගැනීම සහ සමාජයෙන් පිටමං නොවීමට නිරන්තරව උත්සහ දරණ අය වේ. සමරිසියෙකු වීම යනු තම දරුවාට තුළ ඇති කරන්නා වූ අමතර පීඩනයකි. මිතුරු ශිෂ්‍ය ශිෂ්‍යාවන් සමරිසිභාවය කෙරෙහි කාරුණික වන්නේ ඉතාම කලාතුරකිනි. එමෙන්ම හෝමෝන ක්‍රියාකාරීත්වය ඉතාම ප්‍රභාරාත්මක වන පාසැල් පරිසරයේදී දරුවන් තම ලිංගිකත්වය ගැන ඉතාම සවිඥාණිකය. තමන් LGBT වීමේ හැකියාවක් ඇත යන අවබෝධය තුළින් ඔබේ දරුවාට තමන් නොසෑහෙන බවක්, අසරණ බවක් සහ පහත් බවක් දැනෙනු ඇත. ඔවුන් තුළ ක්‍රම ක්‍රමයෙන් තමන් ගැන ලැජ්ජාවක් සහ තමන් ගැනම වෛරයක් දැනෙන්නට ඇති විය හැකිය.

ඔබ ඔවුන් ගැන ආඩම්බර වන බව දරුවාට පෙන්විය යුත්තේ මේ නිසාම ය. සමරිසියෙකු වීම ලෙහෙසි පහසු නොවන බව තම දරුවන්ට පෙන්වා දෙමින්, ඔවුන් එම තත්වය සමඟ ජීවිතය හසුරවා ගන්නා ආකාරය ගැන වර්ණනා කරන්න. දරුන්ට ඔවුන්ගේ අනෙකුත් ජයග්‍රහණයන් සහ දක්ෂතාවයන් ගැන මතක් කර දෙන්න. ඔවුන් සමරිසි වීමෙන් ඒ දේවල් ඔවුන්ගෙන් නැතිවී ගොස් නැති බව ඔවුන්ට පෙන්වා දෙන්න. සමරිසි වීම නිසා ඔබේ දරුවන් ලෙස හෝ පොදුවේ මිනිසුන් ලෙස ඔවුන් අවලංගු වී නොමැති බව පෙන්වා දෙන්න.

## ඔවුන්ට දරාගැනීමේ හැකියාව ලබාදෙන්න

සමරිසි දරුවන්ට කුරිරු ආකාරයෙන් අවමන් කරන අපගේ සමාජය තුළ ඔබේ දරුවාට කර්කෂ වදන්, නම් පටබැඳීම්, වෛරයන් සහ කොන් කිරීම්වලට මුහුණ දෙන්නට සිදු වේවි. ශ්‍රී ලංකාවේ බහුලව පැතිරුණු සමලිංගික භීතිය නිසා තම දරුවන්ට නිරර්ථක අසාධාරණයන්ට මුහුණ දීමට සිදු විය හැක.

දෙමව්පියෙකු ලෙස ඔබ ඔවුන්ට දරාගැනීමේ හැකියාව ඉගැන්විය යුතුයි. සමාජයේ විවිධාකාරයේ අසාධාරණයන්ට ලක්වූවන් සිටින බවත් විවිධාකාරයේ ජන කණ්ඩායම් කොන් කර තිබෙන බවත් ඔවුන්ට පෙන්වා දෙන්න. මෙම විපත්තීන්ට එරෙහිව අපේ හිස කෙළින් තබාගත යුතු බවත් නැතිනම් අපිට සැමදාම මෙම දැඩි මතධාරීන්ගේ වෛරයට හැමදාම හිස නමන්නට වනු ඇති බව ඔවුන්ට පෙන්වා දෙන්න. ඔබේ දරුවාට ඔබේ පිළිගැනීම ලබා දෙන්න. එමෙන්ම දරුවාට පවුල, සහ මිතුරන්ගේන් සැදුම් ලත් සම්බන්ධකම් ජාලයක් තනා ගැනීමට උපකාර කරන්න. සමාජය තම දරුවා කොන් කිරීමට, පහළට ඇද දැමීමට උත්සාහ කරන විට, දරුවාට කෙළින් නැඟී සිටීමට උදව් කිරීමට ඔබ ඔහු හෝ ඇය අසලම සිටින්න.

ඒ අතරතුර දී සමරිසියන්, ද්විරිසියන් හා සංක්‍රාන්ති සමාජභාවීය කෙරෙහි වන නිශේධනාත්මක සමාජීය ආකල්ප වෙනස් කිරීමට මුලපිරීම් කරන්න. ඔබ ඉදිරියේදී වෙනස් ලිංගිකයන් ගැන පරුෂ විහිළු තහළු කිරීමට ඉඩ නොතබන්න. සමරිසිභාවය සම්බන්ධයෙන් පිළිගත නොහැකි ප්‍රකාශ සහ මිත්‍යාවන් අභියෝගයට ලක් නොකර යෑමට ඉඩ නොදෙන්න. පොදුවේ සියලූ ලිංගික දිශානතීන් සහිත පුද්ගලයන්ගේ මානුෂිකත්වය, සමානාත්මතාවය සහ අභිමානය වෙනුවෙන් පෙනී සිටින්න. එසේ කිරීමෙන් ඔබේ දරුවාට වඩා හොඳ ලෝකයක් තැනීමට ඔබට උදව් විය හැකියි.

## ඔවුනට සමානාත්මතාවය ලබා දෙන්න

බොහෝ දෙනා සමරිසිභාවයට එරෙහිව නිරන්තරව කියන්නා වූ කාරණයක් නම් එය නීති විරෝධී බවයි. ශ්‍රී ලංකාවේ දණ්ඩ නීති සංග්‍රහයේ 365 (අ) වගන්තියට අනුව සමාන-ලිංගික පුද්ගලයින් දෙදෙනෙකු අතර වන ලිංගික ක්‍රියාවන්ට නීතිය මගින් දඬුවම් කළ හැකියි. මෙම නීතිය 1883 දී බ්‍රිතාන්‍යයින් විසින් ශ්‍රී ලංකා දණ්ඩ නීති සංග්‍රහයට හඳුන්වා දී ඇත. මේ වන විට, බ්‍රිතාන්‍යයන් සමාන-ලිංගික විවාහයන් නීතිගතකර ඇත. තවද, එක්සත් ජාතීන්ද ඇතුළුව බොහොමයක් අන්තර්ජාතික සංවිධාන විසින් මෙම නීතිය ශ්‍රී ලංකාවේ LGBT සමාජයේ මානව අයිතීන්හි ඍජු උල්ලංඝනයක් බව විශ්වාස කරයි. ශ්‍රී ලංකාවද අත්සන් තැබූ සිවිල් හා දේශපාලන අයිතීන් පිළිබඳ අන්තර්ජාතික ගිවිසුම මේ නීතියෙන් උල්ලංඝණය වෙයි. මේ නීතියට එරෙහිව තදින් සිටිමින් එය වෙනස් කිරීමට ඔබේ ආධාරය ලැබෙන්නේ නම් ඔබේ දරුවාට ජීවත් වීමට සුදුසු රටක් බවට ශ්‍රී ලංකාව පත්වෙනු ඇත.

**දිගටම ඔවුන්ගේ ආදරණීය දෙමව්පියන් වන්න.**

ඔවුන්ගේ ලිංගික දිශානතිය කුමක් වුවත් සියලූම තරුණයින් හා දරුවන් ඔවුන් වීමට කැමතිය. ඒ හේතුව නිසා පමණක්ම, ඔබේ දරුවා කරන දේවල් ගැන විමසිලිමත්ව සිටීමට ඔබට වගකීමක් තිබේ. ඕනෑවට වඩා ප්‍රශ්න අහන්නට එපා, එයින් ඔබ දරුවාට ඔහු/ඇය සමරිසි නිසා ඔබ ඔවුන්ව විශ්වාස නොකරන්නේය වැනි අදහසක් ඇති කරනු ඇත. එමෙන්ම දරුවා නොතකා සිටින්නටද එපා. ඔහුගේ/ඇයගේ මිතුරන් කවුරුන්ද යන්නත්, විශේෂයෙන්ම නව මිතුරන්, විවේකය ගත කරන්නේ කොහේද යන්නත්, සහ විවේක කාලයට කුමක් කරන්නේද යැයි යන්නත් සොයා බලන්න. ඔවුන් අන්තර්ජාලයේ සහ ඔවුන්ගේ ජංගම දුරකථනයේ කුමක් කරන්නේද යන්න සොයා බලන්න. ඕනෑම දරුවෙක් අත්වැරදීම්වලට සහ වැරදි තීරණවලට නැඹුරු වීමට බොහෝ විට ඉඩ ප්‍රස්ථා ඇත. LGBT දරුවන්ද එයින් වෙනස් නොවේ.

# ස්තූතිය

තම ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය අනන්‍යතාවය කෙරෙහි තමන්වම ප්‍රශ්න කරමින් සිටින දරුවෙකු ඉතාමත්ම අනතුරට නිරාවරණය වූ තත්වයක සිටියි. එය ඔවුනගේ ජීවිතයේ තීරණාත්මකම යුගයක් වන අතර, ඔවුන්ට දෙමව්පියන්ගේ ආදරය, සහයෝගය සහ මඟ පෙන්වීම අතිශයින්ම අවශ්‍යය. නිවැරදි වේලාවේ නිවැරදි මඟපෙන්වීම සහ සහයෝගය නොලැබෙන නිසා ලෝකය පුරා දරුවන් සිය දහස් ගණන් තමන්ටම හානි පමුණුවා ගනිති, විවිධාකාරයේ ගොදුරු බවට පත්වෙති. බොහොමක් දරුවන් නිවෙස් වලින් එළවා දැමීම සහ දෙමව්පියන් විසින් අතහැර දැමීම පවා සිදුවේ. මේ පොත් පිංච කියවා, ඔබව දැනුවත් කරගෙන, තමන් විසින්ම පසුකර යා නොහැකි ඔහුගේ/ඇයගේ අර්බුදයන් හරහා යෑමට ඔබේ දරුවා ට හැකියාව සපයන්න. මෙය කියවීමෙන් ඇතැම්විට ඔබ දරුවෙකුගේ ජීවිතය බේරාවි. මෙය කියවීමෙන් ඔබ ඇතැම්විට ආදරණීය දෙමව්පියෙකු සහ නොසැලකිළිමත් දෙමව්පියෙකු අතර වෙනසක් ඇති කර හැක.

වැඩිදුර තොරතුරු සහ සම්පත් සඳහා විමසන්න.

## සුභ පැතුම්.

# වැඩිදුර තොරතුරු සහ සම්පත් සඳහා විමසන්න.

EQUAL GROUND, ශ්‍රී ලංකාව

EQUAL GROUND සංවිධානය ශ්‍රී ලංකාවේ ස්ත්‍රී සහ පුරුෂ සමරිසි, ද්විරිසි, සංක්‍රාන්ති සමාජභාවීය, අන්තර් ලිංගික හා ලිංගික දිශානතිය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවීය ප්‍රශ්නභාවී ප්‍රජාවගේ LGBTIQ) එක්සත් බව සහ ලිංගික දිශානතිය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ/හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවීය  ප්‍රකාශනය ඇතුලූ සියලූම ආකාරයන්ගේ කොන්කිරීම්වලට එරෙහිව පෙනී සිටීමෙන් කිරීමෙන් සාධාරණ, මානව හා දේශපාලන අයිතීන් බලාපොරෙත්තු වෙයි. EQUAL GROUND ආයතනය වර්තමානයේ LGBTIQ පුද්ගලයින්ට "ආරක්ෂිත අවකාශයක්" ක්‍රියාත්මක කරමින් පවති යි. තවද, LGBTIQ පුද්ගලයින්ට සෘජු දුරකථනමය උපදේශන සේවාවක් පවත්වාගෙන යයි. උපදේශන සේවය පැවැත්වෙනුයේ සඳුදා සිට සිකුරාදා දක්වා පෙ.ව. 9.30 සිට ප.ව. 5.30 දක්වාය.

**දුරකථන**: 0114334278/ 0114334277

**අන්තර්ජාලය**: http://www.equal-ground.org

**ඊමේල්**: equalground@gmail.com

**සටහන්:**



EQUAL GROUND

“සියලුම ලිංගික යොමුවීම් සහ සමාජ-ලිංගික අනන්‍යතාවයන්ට සමානාත්මතාවය:
සැමට මානව හිමිකම්”


දුරකථන: 0114334278 / 0114334277

අන්තර්ජාලය: http://www.equal-ground.org

ඊමේල්: equalground@gmail.com